# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2016 ඔක්තෝම්බර් 27** **ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධාන** **2016 අංක 02**

## ව්‍යවස්ථාපිත සංචිත

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 11 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ව්‍යවස්ථාපිත සංචිත

1.1. සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම ව්‍යවස්ථාපිත සංචිතයක් පවත්වා ගත යුතු අතර සෑම වසරකම බදු ගෙවීමෙන් පසු සහ ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර ශුද්ධ ලාභයෙන් පහත පරිදි සංචිත අරමුදලට මාරු කළ යුතුය.

අ. ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට පනහකට (50%) සමාන වනතුරු ඉහත ලාභයෙන් සියයට පහකට (5%) නොඅඩු ප්‍රමාණයක්; සහ

ආ. ප්‍රකාශිත ප්‍රාග්ධනයට සමාන වන අගයක් දක්වා ඉහත ලාභයෙන් සියයට දෙකයි දශම පහකට (2.5%) කට නොඅඩු ප්‍රමාණයක්.

2. අර්ථනිරූපනය

2.1. 2007 අංක 07 දරන සමාගම් පනතේ 58 වගන්තියේ නිර්වචනය කර ඇති පරිදි සමාගමක අදාළ ප්‍රකාශිත ප්‍රාග්ධනය යනුවෙන්,

අ. කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන්; සහ

ආ. කොටස් මත වූ ඇරයුම සම්බන්ධයෙන්

සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු සහ ගෙවිය යුතු සියලු මුදල් වල එකතුව අදහස් වේ.

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති